**ශීර්ෂය 188 - උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයේ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර, 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| **ශීර්ෂය** | **දෙපාර්තමේන්තුව** |
|---|---|
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව |
| 322 | ජාතිත උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 188 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 2016 පෙබරවාරි 10 දින |
| 294 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 2016 පෙබරවාරි 10 දින |
| 322 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 2015 ජුලි 18 දින |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ සහ ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයක් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක් සඳහා සළසා තිබුණු රු. මිලියන 1,550.9 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 1,180.4 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 5.8 ක සිට රු.මිලියන 355.4 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 0.8 ක සිට සියයට 48 ක් දක්වා පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 188 | 150.38 | 141.13 | 9.25 | 6.15 |
| 294 | 661.83 | 656.01 | 5.82 | 0.88 |
| 322 | 738.73 | 383.31 | 355.42 | 48.11 |
| **එකතුව** | **1,550.94** | **1,180.45** | **370.49** | **23.89** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත තථ්‍ය ආදායම්

අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේතයක් වෙනුවෙන් එකතුව රු.මිලියන 432.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රුපියල් මිලියන 464.51 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 107.5 ක ආදායම් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තු දෙකකට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 18801 | 2.06 | 2.06 | 0.30 | 1.04 | 5.00 | 3.33 |
| 29401 | 12.00 | 11.93 | 8.00 | 9.50 | 58.00 | 46.31 |
| 32201 | 17.00 | 14.79 | 9.00 | 15.25 | 70.00 | 54.55 |

## 2.4 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 153.49 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දින ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 7002/0000/00/0427/0014/000 | 16.62 |
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0146/0014/000 | 97.70 |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0405/0014/000 | 39.17 |
| **එකතුව** | | **153.49** |

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රුපියල් මිලියන 176.66 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0204/000 | 29.00 |
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0149/000 | 131.04 |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0167/000 | 16.62 |
| **එකතුව** | | **176.66** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් 1.1

ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 6 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂය 188 - උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 විගණන සාක්ෂි නොවීම**

ලංසු මුල් පිටපත්, අත්සන් කරන ලද වැටුප් වාර්තා ආදී වූ අවශ්‍ය සාක්ෂි අමාත්‍යාංශයෙහි නොතිබීම නිසා එකතුව රු.9,984,286 ක් වටිනා ගනුදෙනු 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**3.3 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.1,750,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 04 කට අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60 ක සිට සියයට 98.5 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) වැඩසටහන් 1 යටතේ අමාත්‍ය කාර්යාලය සඳහා වැය කර තිබුණු රු. 2,707,027 ක් වැඩසටහන් 2 පාලන හා ආයතන ක්‍රියාකාරකම් යටතේ සඳහන් කර තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශයේ ඉදිකිරීමක් වෙනුවෙන් මධ්‍යම ඉංජිනේරුමය උපදේශක කාර්යාංශය වෙත රු.මිලියන 25 ක් 2014 දෙසැම්බර් 22 දින ගෙවා තිබුණි. එම ඉදිකිරීම සම්බන්ධ තාක්ෂණ වාර්තාව 2014 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබීම නිසා එය තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2015 අගෝස්තු 13 දින වන විටත් එම මුදල දෙපාර්තමේන්තුව වෙත පියවා නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 18801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශයේ තථ්‍ය හර ශේෂය රු.3,328,421 ක් විය. ඉන් රු. 3,275,746 ක් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයෙන් අයකර ගත යුතු වූ අතර විශ්‍රාම ගිය හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු. 75,566 ක් අයකර ගත යුතුව තිබුණි. ඒ අනුව ඉතිරි රු. 22,891 ණය ශේෂ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වූවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ ක්‍රියාකාරී සැලැස්මේ 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් ඉදිරිපත් කර නොතිබූ අතර, අමාත්‍යාංශය යටතේ වූ ආයතනවල ක්‍රියාකාරකම් පමණක් ඉදිරිපත් කර තිබුණි.

### 3.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 3.6.3 අභ්‍යන්තර විගණනය

වැඩබැලීමේ පදනම මත 2014 ඔක්තෝබර් 01 දින අභ්‍යන්තර විගණකවරයකු පත් කර තිබුණද, විගණන වැඩසටහන් සකස් කර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.6.4 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයකට කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් වත් පැවැත්විය යුතු වූවද, 2014 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

### 3.7 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

#### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වූවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2015 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

#### (ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

අමාත්‍යාංශය විසින් විධිමත් පරිදි වත්කම් පවරා නොගෙන එම වත්කම්වල සිදුකර තිබුණු ඉදිකිරීම් සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කුරුණෑගල ඉඳුල්ගොඩකන්ද නිශ්ශංක මහා විද්‍යාලයේ අක්කර 2 ½ ක භූමි භාගයක පාරිසරික උද්‍යානයක් ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 5 ක් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත 2014 සැප්තැම්බර් 30 දින ලබාදී තිබුණි.

(ii) ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ පුහුණු ශාලාවේ දේශනාගාරය හා කෑම කාමරය ඉදිකිරීම සඳහා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 7 ක් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත 2014 සැප්තැම්බර් 30 දින ලබාදී තිබුණි. වර්ෂය තුළ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා සළසා තිබුණු රුපියල් මිලියන 10 ක් ප්‍රතිපාදනවලින් වෙනත් ආයෝජන වැය විෂයට ප්‍රතිපාදන මාරු කරගෙන මෙම උපයෝජනය කර තිබුණි.

(ඇ) **බේරුම් නොකළ බැරකම්**

අමාත්‍යාශයේ 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයට අඩු කාලයක සිට පැවැත එන එකතුව රු. 398,695 ක බැරකම් විය.

## 3.8 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104 හා 1642 | 239,758 | වාහන අනතුරු 03 ක් පිළිබඳ මු දල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| (i) 3.2 මාර්ගෝපදේශය | 38,880,309 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාගොල්ල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 05 ක් ලංසු කැඳවීමකින් තොරව සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියට පැවරීමට අමාත්‍යාංශය කටයුතු කර තිබුණි. |
| (ii) 2.7.4 (ඈ) මාර්ගෝපදේශය | 45,563,259 | නියැදි විගණන පරීක්ෂාවට අදාල කරන ලද කොන්ත්‍රාත් 06 ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රසම්පාදන කමිටුවට සහභාගී වූ නිලධාරීන් තිදෙනාම අමාත්‍යාංශය අභ්‍යන්තර නිලධාරීන් වූ අතර මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශයෙන් බැහැර ආයතනයක නිලධාරියෙකු ඒ සඳහා සහභාගී කරගෙන නොතිබුණි. |
| (iii) | 2.14 (1) මාර්ගෝපදේශය | 186,870 | අමාත්‍යාංශය විසින් වාහන 03 ක් අළුත්වැඩියා කිරීම සඳහා මිල කැඳවීම් 03 ක් මගින් සිදු කළ යුතු වුවත් මිල ගණන් දෙකක් පමණක් ලබා ගෙන අළුත්වැඩියාවන් සිදු කර තිබුණි. |

## 3.9 කාර්යසාධනය

2014 වර්ෂයේ අයවැය යෝජනා අතර පහත සඳහන් යෝජනා දක්වා තිබූ නමුත්, අමාත්‍යාංශය මගින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් ඒවා ක්‍රියාවට නංවා නොතිබුණි.

(අ) කොළඹ - කුරුණෑගල, කොළඹ - නුවර හා කොළඹ - ගාල්ල යන අධිවේගී මහා මාර්ගයන් පදනම් කර ගනිමින් සේවා සපයන මධ්‍යස්ථාන පිහිටුවීම (Comfort Centers)

(ආ) සංචාරක කර්මාන්තය ප්‍රචලිත ප්‍රදේශයන් පදනම් කර ගනිමින් සමුද්‍රීය පාරිසරික උද්‍යානයන් (Ocean Parks) ඉදිකිරීම යටතේ ඒ අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිලාවේලි ප්‍රදේශය මුල් කරගෙන සමුද්‍රයීය පාරිසරික උද්‍යානයක් ඉදිකිරීම

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති මෙම අමාත්‍යාංශයට පැවරීමට නියමිතව තිබූ නිවාඩු නිකේතන (Holiday Restaurant) කිහිපයක් ඉදිරියේදී මෙම අමාත්‍යාංශය යටතේ ලබාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කිරීම

(ඈ) පිට පළාත්වල සිට විවිධ රාජකාරීන් සඳහා කොළඹට පැමිණෙන රාජ්‍ය නිලධාරීන් නවාතැන් ගැනීම උදෙසා සැලසුම්ගත නිවාඩු නිකේතනයක් ඉදිකිරීම

(ඉ) පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක වන දැනට නිසි නඩත්තුවකින් තොරව පවත්වාගෙන යනු ලබන තානායම් අළුත්වැඩියා කිරීම සිදුකර ඒවා පාලනය කිරිමට නියමිත ක්‍රමවේදයන් ඔස්සේ පළාත් පාලන ආයතනවලට බලය ලබාදීම සඳහා එම තානායම් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීම.

## 3.10 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු මතභේදාත්මක ස්වරූපයේ වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) අමාත්‍යාංශය විසින් 2014 පෙබරවාරි මාසයේදී රු.6,682,950 ක් වැය කර වාහනයක් මිලදී ගෙන තිබුණි. එම වාහනය මිලදී ගැනීමට පෙර පිළියෙල කර තිබුණු පිරිවිතරය අනුව පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

- Wheel base to be between 2500-2600 විය යුතු වුවත්, මිලදී ගෙන තිබුණු වාහනයේ එම පරතරය 2968 ක් වී තිබුණි
- වාහනයේ උපරිම පළල මි.මී.1700 ක් නොඉක්මවිය යුතු වුවත් මිලදී ගෙන තිබුණු වාහනයේ පළල මි.මී.1860 ක් වී තිබුණි.

ඉහත සඳහන් වෙනස සුළු වෙනස්කම් ලෙස සළකා තාක්ෂණ ඇගැයීම් කමිටුව විසින් එම ලංසුකරු තෝරා ගැනීම නිර්දේශ කර තිබුණි.

(ii) 2014 නොවැම්බර් මාසයේදී රු.9,595,729 ක ඇස්තමේන්තුවකට නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රජයේ මණ්ඩලයක් වෙත ලබාදී තිබුණි.

## 3.11 අධිකාරී බලය නොමැතිවූ ගනුදෙනු

අමාත්‍යාංශය විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු කර තිබුණි.

(i) නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ වියදම රු.9,429,703 ක් වී තිබුණත්, අදාල වැය විෂය යටතේ රු.10,274,361 ක් වැය කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටුව අනුමත කළ වියදම රු.844,688 කින් ඉක්මවා ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

(ii) පිරිවැය රු.38,880,309 ක් වූ පින්නවල නව සත්වෝද්‍යානයේ ප්‍රවේශ ප්‍රදේශයේ ඉදිකිරීම් කාර්යයන් 05 ක් යටතේ වෙන වෙනම හඳුනාගෙන ඉතා හදිසි හා ඉතා විශේෂිත කටයුතු සේ සළකා රජයේ ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව විධිමත්ව පත් නොකළ කමිටුවක් විසින් තීරණය කර කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

## 3.12 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරේක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 04 | 05 | - |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - | - |
| (iii) | ද්විතියික මට්ටම | 20 | 14 | 06 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 10 | 09 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 10 | - | 10 |
| | **එකතුව** | **50** | **40** | **20** | **10** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂය - 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

## 4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |

## 4.2 විසර්ජන ගිණුම

-----------------

### 4.2.1 අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.3,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12.84 ක සිට සියයට 86.06 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලට අමතරව සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධක අරමුදලෙන්ද උපයෝජනයන් සිදු කිරීම නිසා ශිර්ෂය යටතේ වන වියදම්වල අධි වැය ඇතිවීම වලක්වාගෙන තිබුණි. දෙපාර්තමේන්තුවේ එක් එක් අයිතම සඳහා වූ සමස්ථ වියදම් ඇස්තමේන්තුකර දෙපාර්තමේන්තුව හා අරමුදල අතර නිශ්චිත පදනමක් අනුව වියදම් බෙදාහැර නොතිබුණි.

## 4.3 අග්‍රිම ගිණුම්

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 22 දින භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලද රු. 35,000,000 ක අග්‍රිමයෙන් රු.30,000,000 ක් උපයෝජනය නොකර 2014 දෙසැම්බර් 29 දින භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි. දෙපාර්තමේන්තුවේ කටයුතු වෙනුවෙන් රු. 10,000,000 ක් 2014 දෙසැම්බර් 31 දින සත්වෝද්‍යාන සංවර්ධන අරමුදලින් මාරු කර ගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළයුතු වුවත්, නිලධාරීන් 12 දෙනෙකුට අවස්ථා 13 ක දී ලබාදී තිබුණු එකතුව රු. 205,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිමවී මාස 1 ½ සිට මාස 09 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව එම අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ඇ) එක් කාර්යයක් වෙනුවෙන් නිශ්චිත නිලධාරියෙකුට පමණක් අත්තිකාරම් ලබාදිය යුතු වුවත්, කාර්යයන් 04 ක් වෙනුවෙන් නිලධාරීන් 19 දෙනෙකුට රු. 404,500 ක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි.

(ඇ) තත්ත්කාර්යය අතුරු අග්‍රිම වශයෙන් නිලධාරීන් 05 දෙනෙකු වෙත ලබා දෙන ලද එකතුව රු.71,000 ක් අදාල කාර්යය සඳහා යෙදවීමෙන් තොරව මාස 1 ½ ක සිට මාස 9½ ක් දක්වා කාල පරාසයක් අත රඳවාගෙන සම්පූර්ණ මුදලම දෙපාර්තමේන්තුව වෙත ආපසු නිරවුල් කර තිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව විසින් බැංකු ජංගම ගිණුම් දෙකක වූ පිළිවෙලින් රු.59,416,515 ක් හා රු.8,269,331 ක් වූ මුදල් ශේෂ 2014 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළයුතු වූවද, එම මුදල් 2015 ජනවාරි 19 දින ප්‍රේෂණය කර තිබුණි.

## 4.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 29401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,321,890 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක සිට එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) අත්තිකාරම් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට හර ශේෂය හා එදිනට කේවල ශේෂ වර්ගීකරණයේ සාරාංශයේ එකතුව අතර රු. 63,504 ක වෙනසක් පැවැතුණි.

## 4.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර නොතිබුණු අතර, අමාත්‍යාංශ විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනය සිදුකර නොතිබුණි.

## 4.6 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

වාගොල්ල සත්වෝද්‍යානය ඉදිකිරීම සඳහා පවරා ගෙන තිබූ මාර්ගයේ වම් පස ඉඩම් හෙක්ටයාර 1.45 ක් වසර 15 ක සිට ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය විය.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වූවත්, අමාත්‍යාංශය විසින් 2015 මැයි 31 දින වනවිටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

දෙපාර්තමේන්තුව විසින් විධිමත්ව පවරා නොගත් අක්කර 15 කින් පමණ යුත් ගෝනපල පිහිටි ඉඩමක සත්වෝද්‍යාන ගොවිපල පවත්වාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂයට වඩා අඩු කාලයක සිට පැවැත එන රු.159,192,176 ක බේරුම් නොකළ බැරකම් විය.

## 4.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.4 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට අමාත්‍යාංශයෙන් පරිබාහිරවූ පුද්ගලයෙකු ඇතුළත් වියයුතු වූවද, දෙපාර්තමේන්තුවේ වාගොල්ල නව සත්වෝද්‍යානයේ ඉදිකිරීම්වලට අදාලව රුපියල් මිලියන 62.6 ක් වූ කොන්ත්‍රාත්තු ලබාදීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් තිදෙනාම අමාත්‍යාංශයේ නිලධාරීන් විය.

## 4.8 කාර්යසාධනය

වත්තල හැමිල්ටන් ඇල ආශ්‍රිත සංචාරක ව්‍යාපෘතියට සමගාමීව අන්තර් ජාතික මට්ටමින් මින්මැදුරක් ඉදිකිරීමට 2009 වර්ෂයේ සිටම ඇස්තමේන්තු ප්‍රතිපාදන සළසා තිබූ අතර, 2014 වර්ෂයේදී ද වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.5,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2014 වර්ෂයේදී එම කාර්යය නිම කිරීමට අපේක්ෂිතව තිබුණද 2015 අගෝස්තු 15 දින වන විටත් එම කාර්යය ආරම්භ කර හෝ නොතිබුණි.

## 4.9 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සැලැස්මට අනුව දෙහිවල සත්වෝද්‍යානයේ මධ්‍යම ශ්‍රේණියේ නිල නිවාස දෙකක් සහ සංචාරක නිවාසයක් ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත්තුව 2012 නොවැම්බර් 02 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. 2012 හා 2013 වර්ෂවල ඒ සඳහා ප්‍රතිපාදන සළසා ගෙන නොතිබුණි. තවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මෙම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් ලබා දී නොතිබුණි. කෙසේ වූවද, 2014 වාර්ෂික ඇස්තමේන්තුවෙන් මෙම කාර්යය සඳහා මිලියන 30 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර, දෙපාර්තමේන්තුව විසින් සංචාරක නිවාසය ඉදිකිරීම අත්හැර ඒ වෙනුවට මධ්‍යම ශ්‍රේණියේ නිල නිවාස 03 ක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඒ සඳහා මිලියන 17.8 ක් වැය කර තිබුණු අතර, සංචාරක නිවාසය වෙනුවට නිල නිවාසයක් ඉදිකිරීම සඳහා ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

සත්වෝද්‍යානය අක්කර 23 ක් වූ සීමිත ඉඩකඩක පවත්වාගෙන යන අතර, දැනට ඒ තුළ නිල නිවාස 27 ක් ඉදිකර තිබියදී තවදුරටත් නිල නිවාස ඉදිකරමින් පවතින අතර, සත්වෝද්‍යානය භූමිය සම්බන්ධයෙන් වූ ප්‍රධාන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) පින්නවල නව සත්වෝද්‍යානයේ ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු. 77,627,967 ක් වූ කොන්ත්‍රාත්තු 11 ක් සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාන හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත 2014 වර්ෂයේදී පවරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රුපියල් මිලියන 62.6 ක් එම අධිකාරියට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2014 පෙබරවාරි මාසයේදී “දැයට කිරුළ”ට සමගාමීව විවෘත කිරීමේ අරමුණින්, ලංසු කැඳවීමට විශාල කාලයක් වැය වන බවත්, ඉතා හදිසි කාර්යයක් ලෙස සඳහන් කර රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාන හා යන්ත්‍රෝපකරණ අධිකාරියට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. නමුත් 2014 දෙසැම්බර් 31 වන විටත් මෙම නව සත්වෝද්‍යානය විවෘත කර නොතිබූ අතර, ඉදිකිරීම්වල කාලයද මාස 1 සිට 4 ½ ක් දක්වා දීර්ඝ කර ගෙන තිබුණි.

- අමාත්‍යාංශයේ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව සියළුම උපදේශන කටයුතු අමාත්‍ය මණ්ඩල තීරණ අංක 13/1434/562/008 අනුව මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙත පවරා තිබියදී, ඊට පටහැනිව මෙහි උපදේශක කාර්යයන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට පවරා තිබුණි. 2014 දෙසැම්බර් 31 වන විට ඒ සඳහා රු. 4,997,597 ක් ගෙවා තිබුණි.

- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ උපදේශක ලෙස එක් නිලධාරියෙකු (වාස්තු විද්‍යාඥ) සියළු ලිපි සඳහා අත්සන් කර තිබූ නමුත්, ඔහු වැඩ පැවරුම් පදනම මත රාජකාරී කටයුතු කරනු ලබන නිලධාරියෙක් විය.

- තවද, මෙම කොන්ත්‍රාත් 11 කට අදාලව ඉංජිනේරු ඇස්තමේන්තුව හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් සකස් කළ බවට සාක්ෂි ගොනුවේ නොතිබූ අතර, සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සකස් කළ ඇස්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. මීට අමතරව උපදේශක විසින් කොන්ත්‍රාත් සුපරීක්ෂණයක් සිදුකළ බවටද සාක්ෂි ඉදිරිපත් නොවුණි.

### 4.10 අධිකාරී බලය නොමැතිවූ ගනුදෙනු
---------------------------------------

සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 5 ක් වැය කර ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සෆාරි උද්‍යානය වෙත පැස්බරුන් ජෝඩු 02 ක් මිලදී ගෙන තිබුණි. එම පැස්බරුන් විදේශයෙන් ආනයනය නොකර, ශ්‍රී ලංකාව තුළින්ම මිලදී ගැනීම සුදුසු බව අතිරේක අධ්‍යක්ෂ විසින් තීරණය කර තිබුණි.
අතිරේක අධ්‍යක්ෂ විසින් පුවත්පත් දැන්වීමක් මගින් ලංසු කැඳවා මෙම මිලදී ගැනීම සිදුකළ යුතු බව දක්වා තිබුණද, අධ්‍යක්ෂ විසින් සීමිත මිල කැඳවීම් කර මිලදී ගන්නා ලෙස සටහන් (Minutes) මඟින් දක්වා තිබුණි. ඒ අනුව පුද්ගලයින් 06 දෙනෙකුගෙන් පමණ මිල ගණන් කැඳවා තිබූ අතර, ඉන් දෙදෙනෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. එම දෙදෙනාටම එම ලංසු කැඳවීම් ලිපියේ කොන්දේසි අනුව අවශ්‍ය සුදුසුකම් වන Fauna and Flora Protection Ordinance යටතේ මෙම සතුන් සඳහා අවසර පත්‍ර හිමි පුද්ගලයින් නොවිණි. ඉහත කරුණු

සළකා බැලීමේදී අධ්‍යක්ෂ විසින් ගෙන තිබූ ඉහත තීරණය මතභේදයට තුඩුදෙන්නක් විය. ගනුදෙනුව විනිවිදභාවයකින් තොරව සිදුවී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 29 | 21 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 158 | 110 | 48 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 587 | 312 | 173 |
| (v) | වෙනත් (අනියම්) | - | 102 | - |
| | **එකතුව** | **776** | **545** | **231** |

## 5. ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

## 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| ( ඈ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (ඉ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) |

**5.2 විසර්ජන ගිණුම**

**-------------------**

**අය වැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු පළාතේ උද්භිද උද්‍යානයක් සැකසීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඒ සඳහා සළසා තිබූ රු.3,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් හා සියයට 51 ක් වී තිබුණි.

**5.3 පොදු තැන්පත් ගිණුම**

**------------------------**

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.3,282,728 ක් වූ තැන්පතු 22 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**5.4 ආදායම් ගිණුම**

**----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන් දීමේ නිලධාරී වශයෙන් ආදායම් සංකේත අංක 20.03.02.19 හි ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවරී තිබුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 432 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 464.5 ක් රැස්කර තිබුණි. එම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 7.5 ක අතිරික්ත ඉපයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් සංශෝධිත ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර නොතිබුණි.

**5.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**----------------------------------------------------------------------**

විෂය අංක 32201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.440,625 ක් වූ අතර, එම මුළු ශේෂයම විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ව තිබුණි. එම ශේෂවලින් එකතුව රු.200,675 ක් ණය ශේෂ වර්ෂ 04 කට වඩා වැඩි කාලයක සිට හිඟහිටව පැවැත එමින් තිබුණි.

(ආ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන පරිදි අවස්ථා 04 කදී එකතුව රු.1,561,113 ක ආපදා ණය ගෙවා තිබුණි.

5.6 වත්කම් කළමනාකරණය
-------------------------------
දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බාහිර පාර්ශවයන් විසින් අවිධිමත්ව පරිහරණය කරනු ලබන වත්කම්**
**-----------------------------------------------------------------------**
හක්ගල උද්භිද උද්‍යානයට අයත් ඉඩමෙන් හෙක්ටයාර් 18 ක් අනවසරයෙන් බාහිර පාර්ශවයන් විසින් අත්පත් කරගෙන තිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**
**--------------------------**
දෙපාර්තමේන්තුව විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂ එකකට වඩා අඩු කාලයක සිට පැවත එන බැරකම්වල වටිනාකම රු.6,747,945 ක් වී තිබුණි.

**6.7 කාර්ය සාධනය**
**-----------------**
2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැළැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**
**------------------------------------------------**
මල් වගා කර්මාන්තය සංවර්ධනය හා උද්‍යාන අලංකරණය ප්‍රචලිත කිරීමට අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩ සටහන් ක්‍රියාවට නැංවීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, ඒ සඳහා මල් වගා ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා රු.500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදනවලින් රු.22,200 ක් හෙවත් සියයට 4.4 ක් සහ උද්භිද උද්‍යාන පර්යේෂණ කටයුතු සඳහා සළසා තිබුණු රු 250,000 ක ප්‍රතිපාදනවලින් රු.7,299ක් හෙවත් සියයට 2.9 ක් වැනි ඉතා පහළ මට්ටමක ප්‍රතිපාදන උපයෝජනයන් සිදු කර තිබුණි.

(ආ)  **සැලසුම් කිරීම**

---------------

වාර්ෂික ක්‍රියාකාරි හා ප්‍රසම්පාදන සැලැස්මෙහි රු.1,150,000 ක මූල්‍ය ප්‍රතිපාදන සළසා තිබූ කාර්යයන් 03 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබුණු අතර, කාර්යයන් 08 ක් සඳහා සළසා තිබුණු රු.10,300,000 ක ප්‍රතිපාදනවලින් රු.2,461,555 ක් උපයෝජනය කර තිබුණි. එම ප්‍රමාණය එක් එක් කාර්යයන් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 05 සිට සියයට 47 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**5.8** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 33 | 15 | 18 |
| (ii) | තෘතියික මට්ටම | 09 | 05 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 186 | 106 | 80 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 516 | 502 | 14 |
| | එකතුව | 744 | 628 | 116 |